www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාකයේ එක්සත් ජනපද යුද්ධය හා යටත් කිරීම - සමාජයක් ඝාතනය කිරීම

## පලමු වන කොටස

## The US war and occupation of Iraq—the murder of a society

බිල් වෑන් ඕකන් විසිනි
2007 මැයි 19

*කොටස් තුනකින් යුත් ලිපි පෙලක පලමුවැන්න මෙහි පල වේ.*

එක්සත් ජනපදයේ නිල දේශපාලනය හා මාධ්‍යය, ඉරාකය තුල එය මුහුන දී සිටින මරාලයෙන් ඇමරිකානු ආක්‍රමනිකයා ගලවා ගැනීමේ තරගකාර සැලසුම් කෙරෙහි බොහෝකොටම අවධානය යොමු කර ඇත ද, ඉරාක සමාජය මත ම ඇති කර තිබෙන ඓතිහාසික ව්‍යසනය කෙරෙහි දක්වන්නේ ඉතා නොබැරෑරුම් ආකල්පයකි.

එක්සත් ජනපද යුද්ධයේ හා වාඩිලාගැනීමේ, ප්‍රතිඵල වසයෙන් මියගිය මුලු ඉරාක වැසියන් ගනන පිලිබඳ නිශ්චිත සංඛ්‍යාවන් ඉදිරිපත් කල නොහැකි වුවත් - ආක්‍රමනය හා ඉන් පසුව ඇති වූ සන්නද්ධ ප්‍රචන්ඩත්වයෙන් මියගියවුන් ද, විශේෂයෙන් බාල හා වයස්ගත වූවන් අතර ඝාතනය හා ලෙඩ රෝග නිසා සිය ජීවිතය කෙටි වූවන් ද මීට ඇතුලත් ය - සෑම බැරෑරුම් ගනන් බැලීමකට අනුව අමතරව අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව ලක්ෂ ගනනක සිට දස ලක්ෂය දක්වා විය.

කලෙක කලාපය තුල වැඩි දියුනුම රටවලින් එකක් වූ ඉරාකය, මූලික ආර්ථික හා සමාජ දර්ශකයන්ට අනුව උප සහරානු අප්‍රිකාවේ දුගීම රටවල මට්ටමට ඇද වැටී තිබේ. සිදුව ඇත්තේ දෙවෙනි ලෝක සංග්‍රාමයේ දී හිට්ලර්ගේ හමුදාවන් යුරෝපය විනාශ කල තැන් පටන් අත් නොදුටු ආකාරයේ භීෂන කාරී හා සාපරාධී ක්‍රියා කලාපයක් මුදාහැරීම මගින් සමස්ත සමාජයක්ම ක්‍රමානුකූලව විනාශ කිරීමකි. ඇමරිකානු සමාජයමත් මෙම යුද්ධයේ මාරාන්තික ප්‍රතිවිපාකයන් ගෙන් පීඩාවට පත්ව තිබේ. බැග්ඩෑඩය අවට බෙහෙවින් ජනාකීර්න හා මුලුමනින්ම සතුරු ජනාවාස වෙත ප්‍රහාරක බලඇනි පිටත්කර හැරි බුෂ් පරිපාලනයේ " තල්ලුව" ත් සමග ජීවිත හානි ප්‍රමානය ඉහල නගින බවට සෑම ඇඟවීමක්ම පවතිද්දීම ඉරාකය තුල මිය ගිය එක්සත් ජනපද සොල්දාදුවන්ගේ සංඛ්‍යාව 3400 ඉක්මවා තිබේ.

තවත් 30,000 ක ඇමරිකානු හමුදා භටයන් තුවාල ලබා හෝ විපතට පත්ව ඇති අතර ඉන් බොහොමයකගේ තත්වය බරපතල ය. අසික්කිත යටත් විජිතවාදී යුද්ධයකට සහභාගිවීමේ හේතුව නිසා මානසික ආබාධවලින් පීඩා විඳින තවත් ලක්ෂ ගනනක් සිටින බව නිසැක ය.

එක්සත් ජනපද ආර්ථිකයෙන් යුද්ධයට දෛනිකව ගලා යන මුදල ඩොලර් මිලියන 300කට වැඩි වන අතර එහි මුලු වියදම ට්‍රිලියන 2 ඉක්මවනු ඇතැයි ගනන් බලා ඇත.

කෙසේ වුවද මෙම සාපරාධී යුද්ධය මගින් ඇමරිකානු සමාජයේ දේශපාලනික සමාජ හා සත්තකින්ම මානසික සෞඛ්‍යය ට සිදු කල හානියේ පැත්තෙන් ගත් කල වියදම මීටත් වඩා දැවැන්ත එකකි. ඉරාක යුද්ධය- "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය", " ප්‍රජාතන්ත්‍රවාදය", හා ඉරාක ජනතාවගේ "විමුක්තිය" පිලිබඳ වෙහෙසකර ප්‍රචාරය තිබිය දී ම - ඇමරිකාවේ මූල්‍ය පභූ පැලැන්තිය තවතවත් ධනවත් වීමටත් ඉරාකයේ තෙල් සම්පත නග්න ලෙස සොරකම් කිරීමෙන් සිය ගෝලීය ආධිපත්‍යය සුරක්ෂිත කර ගැනීමටත් දැරූ අසාර්ථක උත්සාහයක් විය.

එක්සත් ජනපදයේ දේශපාලනික හා ව්‍යාපාරික සංස්ථාපිතයේ සෑම කොටසක්ම ද ආන්ඩුවේ සියලු අංශ හා තලයන් ද, ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකම ද ජනමාධ්‍යය ද යන සියල්ලක්ම දැවැන්ත යුද අපරාධවලට වරදකරුවන් වෙති.

සියල්ල එකට ගත් විට ඉරාකය තුල එක්සත් ජනපද ක්‍රියාන්විතයන් sociocide යන වචනයෙන් අර්ථවත් වන ඉතා දැනුවත්ව හා ක්‍රමානුකූලව සමස්ත සමාජයක්ම වනසා දැමීමට සමානය.

දැන් පස්වෙනි වසරට එලඹ ඇති එක්සත් ජනපද ආක්‍රමනික යටත් කිරීම මගින් පන්නරගන්වා ඇති මරනයේ විනාශයේ හා පීඩාවේ පරිමාව මෑත පලවූ වාර්තා මාලාවකින් පෙන්වා දී ඇත.

සමූලෝත්පාටනයේ හා දුෂ් පරිහරනයේ යෙදී සිටින ආක්‍රමනික හමුදාවක් ප්‍රථමකොට ම ඉරාක මහ ජනතාවට එරෙහිව එක්සත් ජනපද ආක්‍රමනය විසින් මුදාහැර ඇති භීෂනය ගෙනහැර පාන වාර්තාවක් මේ මස මුල දී පෙන්ටගනයෙන් නිකුත් කල අතර ඇමරිකානු ආක්‍රමනික හමුදාවේ මානසික තත්වය ඉන් විදහා දැක්වේ. ඉරාක සිවිල් වැසියන් කෙරෙහි පරිපූර්න වෛරය නොවේ නම් කුරිරු නොතැකීම එක්තරා දුරකට ප්‍රකාශයට පත්වන වැඩෙන දිරි සුන් බවේ ද මානසික හා ආවේගාත්මක පක්ෂාගාත වීමෙන් ද

පීඩාවට පත් හමුදාවක චිත්‍රයක් මෙම ලේඛනයෙන් ගෙන හැර දැක්වේ.

හමුදාවෙන් බහුතරයක්, ඉරාක සිවිල් වැසියන්ට "අභිමානයෙන් හා ගෞරවයෙන්" යුක්තව සැලකුම් ලැබීමට අයිතියක් නැති බව විශ්වාස කරන අතර දළ වසයෙන් ඉන් සියයට 10ක් දෙනා පහරදීම් හෝ පෞද්ගලික දේපල විනාශකිරීමේ ආකාරයට ජනතාවට නිස්කාරනයේ හිංසා කල බව පිලිගත්හ.

සමහර විට වඩාත වැදගත් සොයාගැනීම වූයේ එක්සත් ජනපද හමුදා හා මැරීන් සෙබලුන්ගෙන් සියයට 14ක් දෙනා කියා ඇත්තේ "සතුරු ප්‍රහාරකයෙක්" මරාදැමීමට තමන් ඍජුවම වගකිවයුතු බවයි. දැනට ඉරාකය තුල සිටින එක්සත් ජනපද හමුදා භට පිරිස 170,000 ලෙස සලකන කල්හි හා 2003 වසරේ පටන් එක් කාලයක හෝ තවත් කාලයක එහි රඳවා සිටි 650,000 කට වැඩි සංඛ්‍යාව සමග සලකන කල්හි මින් ඇඟවුම් කෙරෙන්නේ එක්සත් ජනපද හමුදාව විසින් ඍජුවම ඉමහත් මනුෂ්‍ය ඝාතනයක් සිදු කර ඇති බවයි.

මෙම සෙබලුන්ගෙන් බොහොමයක් විටින්විට දෙතුන් වතාවක් හෝ ඉරාකය තුල සේවයේ යොදවා තිබේ. එක් අයෙකුට වඩා මරා දැමූ සිද්ධීන් ගැන හෝ ඊටත් වඩා ගුවන් ප්‍රහාර හෝ කාල තුවක්කු ප්‍රහාරයන් ට ගොදුරු වූ විශාල පිරිසක් ගැන ගනන් හිලව් මීට ඇතුලත් නොවේ. ඉරාක නීතියට හෝ හමුදා අධිකරන පටිපාටියට වගකීමෙන් බැඳී නැති දහස් ගනනක් වූ සන්නද්ධ කුලී භට කොන්ත්‍රාත්කරුවන් විසින් මරා දැමුනවුන් ද මීට ඇතුලත් නොවේ.

රටෙහි ඇතිකර තිබෙන මාරක භීෂනයේ සර්වලෝක ස්වභාවය හෙලි කරන තවත් ඇඟවීමක් මෙම වසරේ මුල ඒබීසී නිව්ස්, යූඑස්ඒ ටුඩේ, බීබීසී හා ඒආර්ඩී ජර්මන් ටෙලිවිෂන් මගින් සිදු කල මත විමසුමකින් ප්‍රකාශිතව ඇති අතර ඒ අනුව ඉරාක වාසීන්ගෙන් සියයට 53ක් කියා ඇත්තේ තම සමීප මිතුරෙකු හෝ ඥාතියෙකු එක්කෝ මියගොස් නැති නම් තුවාල ලබා ඇති බවයි.

ඉහල යන මරන සංඛ්‍යාව සමග ම අතුරුදහන් වූවන්ගේ සංඛ්‍යාව ද සැලකියයුතු ලෙස ඉහල ගොස් ඇත. මෙය ආජන්ටිනාව හා චිලිය වැනි රටවල ආඥාදායකත්වයේ නරකම වර්ෂයන් සංකේතවත් කරමින් භාවිතයට ආ මෙම වචනයේ බිහිසුනුකම බෙහෙවින් ඉක්මවා යන්නකි. ඉරාක මානව අයිතිවාසිකම් සංවිධානවල ගනන් බැලීම් අනුව 15,000කට වැඩි සංඛ්‍යාවක් අතුරුදහන්ව ඇති අතර දිනපතා 40-60 අතර ගනනක් මෙම ලැයිස්තුවට එක් වෙයි. වෙනත් වචනවලින් කිව හොත් වාර්ෂිකව 20,000ක මිනිසුන් සංඛ්‍යාවකි. නිසැකවම මින් බොහෝදෙනෙක් මිනීමරු කල්ලි විසින් ඝාතනය කරනු ලැබ ඇති අතර අනෙක් අය රටේ වැඩිවන රැඳවියන් අතරට එක්ව තිබේ. මොවුන් චෝදනා විරහිතව ද නඩු විමසන තාක් දින නියමයකින් තොරව රඳවාතැබීමටත් නිරන්තර වධබන්ධනයන්ටත් ගොදුරුවේ.

ඉරාක මානවහිමිකම් අමාත්‍යාංශය මාර්තු මාසයේ දී නිවේදනය කලේ රැඳවියන් හා සිරකරුවන් 38,000කට ආසන්න ගනනක් සිටින බවයි. එක්සත් ජනපද මිලිටරිය සිය ක්‍රොපර් හා බුකා යන ප්‍රධාන කඳවුරු තුල 19,000ක් රඳවාගෙන සිටින බව පිලිගත්තේ ය. මෙය ඉරාක ජනතාව "විමුක්ත" කර ගැනීමේ එක්සත් ජනපද ආක්‍රමනයට පෙර සදාම් හුසේන් තන්ත්‍රය විසින් රඳවාගෙන සිටි සිරකරුවන් සංඛ්‍යාව මෙන් හය ගුනයකි. ඉරාක ජනතාවගේ විශාල සංඛ්‍යාවක් අතුගා දැමීමේ එක්සත් ජනපද "තල්ලුව" ඉදිරියට යැමත් සමග මෙම සංඛ්‍යාවන් තවත් ඉහල යනු ඇතිබව නිසැකය.

මිලියන ගනනක් ඉරාක වැසියන් අවතැන්වී සහ පිටුවහල් වී සිටිති

ආක්‍රමනිකයා විසින් ඉරාක ජනතාව ගෙන් ලක්ෂ ගනනක් මරුමුවට පත් කලාට අමතරව ඉරාක සමාජය සම්බන්ධයෙන් ගත් කල ඒ හා සමානවූ විනාශ කාරී ඇඟැවීම් කියා පාන්නේ සරනාගතයන් හා අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ විශාල ජනගහනයක් සිටීමෙනි.

තම මව්බිමෙන් පලාගිය ඉරාක වාසීන් සංඛ්‍යාව මිලියන 2ක් යයි ගනන් බලා ඇති අතර ඉන් බහුතරයක් සරන පතා ඇත්තේ සිරියාවේ ජෝර්දානයේ ය. තවත් ඉරාක වැසියන් 19 ලක්ෂයක් රටතුල අවතැන්වූවන්ගේ තත්වයට පත්කර තිබේ. රටේ ජනගහනයෙන් සියයට 15ක් දෙනාම සිය නිවෙස්වලින් පලවා හැර තිබේ. එක්සත් ජාතීන්ගේ සරනාගතයන් පිලිබඳ කොමසාරිස් (යූඑන්එච්සීආර්) ගනන් බලා ඇත්තේ 40,000-50,000 අතර ඉරාක වැසියන් සෑම සතියකම අවතැන් වන බවයි. ඉන් බොහොමයකට කූඩාරම් තුල හෝ කිසිදු උපකාරක මාධ්‍යයක් නොමැතිව එලිමහනේ නිදාගැනීමට බලකෙරේ.

මෑතක දී සිය පවුල සමග සිරියාවට පැමිනි එක් පුද්ගලයෙක් යූඑන්එච්සීආර් වෙත ප්‍රකාශ කලේ " තත්වය ඉතා නරක බැවින් අපි බැග්ඩෑඩය අතහැර ආවෙමු. අපගේ නිවාස හා කඩසාප්පු ඔවුන් අල්ලා ගත් අතර අපට මරන තර්ජන එල්ල කලහ. එහි තත්වය ගැන කිවහොත් ඇත්තේ මරනය හා විනාශයයි."

මෙම මරනය හා විනාශය මුදාහල එක්සත් ජනපදය 2003 සිට පිලිගෙන ඇත්තේ ඉරාක සරනාගතයන් 70% සිටින බව පමනි. දැනට සිරියාව මිලියන 1.2කට පිහිට වෙයි. එක්සත් ජනපදය සරනාගතයන්ගේ මෙම දැවැන්ත අර්බුදයේ වගකීම බාරගන්නවා තබා එය පිලිගන්නේවත් නැති අතර ප්‍රශ්නය යට ගැසීමට උත්සාහ කරන්නේ එය ඉරාකය තුල ඔවුන් නිර්මානය කල සමාජ ව්‍යසනය පිලිබඳ අධි චෝදනා පත්‍රයක්ව තිබෙන බැවින් ය.

නජාෆ්, කර්බාලා හා බස්රා පලාත් ඇතුලත් රටේ දකුනු කොටසේ විශාල අභ්‍යන්තර සරනාගතයන්

ප්‍රමානයක් ගලා ඒම මගින් එන්ට එන්ටම මංමුලා සහගත හා අස්ථාවර තත්වයක් නිර්මානය වී ඇති අතර 700,000ක් පලාගොස් ඇති අතර 200,000ක් ප්‍රදේශය තුල අවතැන් ව ඇති බව ගනන් බලා ඇත. මෙම විශාල ජනගහනයට නිවාස, ආහාර හා සෞඛ්‍ය පහසුකම් සැපයිය නොහැකිව ප්‍රාදේශීය ආන්ඩු හා සහන ආයතන මිරිකී ගොස් ඇත. මූලික ආධාර පවා සැපයීමට බැග්ඩෑඩයේ මධ්‍යම ආන්ඩුව අකැමති හා අසමත් බව සනාථ වී තිබේ.

එක්සත් ජාතීන්ගේ මානුෂික කටයුතු පිලිබඳ සම්බන්ධීකරන කාර්යාලරයේ මාධ්‍ය ආයතනය වන අයිආර්අයිඑෆ් වෙත මාර්තු මාසයේ දී නජාෆ් පලාත්සභාවේ ප්‍රකාශකයෙකු වන අලිෆකුරි කියා සිටියේ "අවතැන් වූවන්ගේ කඳවුරු වෙත දිනපතා පැමිනෙන දුසිම්ගනන් පවුල් හේතුවෙන් ආහාර හා සෞඛ්‍ය සේවා වැනි අත්‍යවශ්‍යය සේවාවන්ගේ හිඟයක් ඇතිව තිබෙන" බවයි. පසු ගිය දෙමාසය මෙම පවුල් සඳහා නරකම කාලය විය. ආරක්ෂක හේතුන් නිසා ආධාර බෙදා හැරීම සැලකියයුතු තරමකින් අඩු වී තිබෙන අතර ප්‍රදේශයේ රෝහල්වල බෙහෙත් හිඟය හා රෝහල් කරා ලඟාවීමේ දුෂ්කරතාවන් නිසා ලදරුවන් ලෙඩ රෝගවලට පහසුවෙන්ම ගොදුරු වෙයි. දකුනේ අවතැන් වූ කන්ඩායම්වල ලදරුවන් අතර පාචනය සාමාන්‍යදෙයක් බවට පත්ව තිබේ."

ඉරාකයේ ලදරු මරන වාර්තාගත ලෙස ඉහල නගී. සමාජ ප්‍රගමනයේ අතිමූලික දර්ශකක් ලෙස ජාත්‍යන්තරව පිලිගත් ලදරු මරන අනුපාතිකයේ ලෝක ප්‍රවනතාවන් ලේඛන ගත කරමින් ලදරුවන් බේරාගනිමු නම් සංවිධානය මගින් මෑතක දී නිකුත් කල වාර්තාවන් වඩාත් සිත් සසල කරයි.

එම වාර්තාවට අනුව 1990 සිට 2005 අතර කාලයේ ඉරාකය ලදරු මරන අනුපාතිකයේ සියයට 150ක වැඩි වීමක් වාර්තා කලාය. දල සංඛ්‍යාවලට අනුව 2005 වසරේ දී මියගිය ඉරාක ලමුන් 122,000 අතුරින් හරි අඩක්ම අලුත උපන් ලදරුවන් ය. වයස අවුරුදු 5ට අඩු ලමයින් 1000කට මරන 125කි. මෙය 1990 දී 50ක් විය. ඉරාක සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව එතැන් පටන් තත්වය බෙහෙවින් නරක අතට හැරී ඇති අතර 2006 වසරේදී එම අනුපාතය උපත් 1000කට මරන 130ක් විය.

ලදරුවන් බේරාගනිමු සංවිධානය මගින් සිය ජාත්‍යන්තර සමීක්ෂනය සඳහා තෝරාගත් වර්ෂයන් ඉරාකය සම්බන්ධයෙන් ගත්විට විශේෂ අදාලත්වයක් අත් කරගැනුනු අතර එක්සත් ජනපදයේ පිටුබලය සහිතව 1990 වසර මුලදී ආරම්භ වූ දඬුවම්කිරීමේ ආර්ථික සම්බාධක ආක්‍රමනයෙන් දෙවසරකට පසුව 2005 දී අවසන් විය. ඉරාකයේ සමාජ ව්‍යසනය පිලිබඳව වැදගත් දර්ශකයන් බොහොමයක දී මෙන්ම ලදරු මරන සංඛ්‍යාවන් ද, කලින් කලට එල්ල කල මිලිටරි ප්‍රහාරයන් මගින් විටින් විට ඇනහිටුවන ලදුව පුරා දශකයකට වැඩි කලක් පවත්වාගෙන ගිය කෲර ආර්ථික ගෙල හිර කිරීම මෙන්ම ආක්‍රමනය හා ඉන් පසුව පැමිනි යටත් කිරීමේ සාහසික ව්‍යසනය යන දෙකම පිලිබිඹු කරයි.

පුලුල් ලෙස ඉහල නැගී ඉරාක ලදරු මරන සංඛ්‍යාව පෙර නුවූ විරූ ය. ඒඩ්ස් රෝගයේ රුදුරු විනාශයෙන් පීඩා විඳ ඇති උප සහරා අප්‍රිකානු රටවල් පවා එවන් බිහිසුනු ප්‍රතිගමනයකට ලඟාවී නැත.

නිසැකවම මෙම ලදරු මරන වලින් සැලකියයුතු පංගුවක වගකීම එක්සත් ජනපදයේ මිලිටරි මෙහෙයුම්වලට පැවරිය හැක. ජනාකීර්න ප්‍රදේශවලට එල්ල කරන ලද සෑම ගුවන් ප්‍රහාරයකට හා බෝම්බ හෙලීමකට ම පාහේ ගොදුරු වූවන් අතර ලදරුවන් ද විය.

කෙසේ වුවද වඩාත් වැදගත් වන්නේ ඉරාකයේ ජල, විදුලි බල හා කසල ශෝධක පද්ධතීන් මෙන් ම සෞඛ්‍යසේවා ජාලයත් මුලුමනින්ම කඩාකප්පල් වීමය. මෙම දෙඅංශයම ලදරුවන්ගේ ප්‍රධාන මාරකයන් - පාචනය, මන්ද පෝෂනය මෙන්ම උනසන්නිපාතය හා සෙංගමාලය වැනි වැලැක්වියහැකි රෝග සඳහා කොන්දේසි නිර්මානය කල අතර නිවාරනයෙන් හා ප්‍රතිකාර කිරීමෙන් වැලකී ගියේ ය.

එක්සත් ජනපද හමුදා විසින් වටලනු ලැබ තිබුනු අන්බාර් පලාත ආක්‍රමනිකයාට එරෙහි ප්‍රතිරෝධයේ මධ්‍යස්ථානය වූවා සේම එක්සත් ජාතීන්ගේ සංවිධානය වාර්තා කලේ 2006 ජනවාරියේ සිට ඉරාකයේ ලමුන් අතර පාචන රෝගය සියයට 70න් ඉහලනැගි බවත් ඉහල ම අනුපාතයන් වාර්තා වූයේ එහි බවත් ය. එම පලාතේ ජනතාවගෙන් සියයට 60කට ම බීමට ලබාගතහැකිව තිබුනේ අපවිත්‍ර ගංගා ජලය පමනි.

රට පුරා ජනගහනයෙන් පිරිසිදු පානීය ජලය ලබාගතහැකි වූයේ 1/3 කටත් අඩු කොටසකට ය. ක්‍රියාත්මක කසල ශෝධන පද්ධතියක් පැවතුනේ සියයට 19කටය. ජල හා කසල ශෝධන පද්ධතීන්ට 1991 පර්සියානු ගල්ෆ් යුද්ධයේදී හා 2003 ආක්‍රමනයේ දී එක්සත් ජනපදය විසින් සිදුකල බෝම්බ ප්‍රහාරයන්ගෙන් බරපතල ලෙස හානි සිදු විය. ඉරාක ආන්ඩුව පෙරලාදැමීමෙන් පසුව ජල පවිත්‍රකරන හා පොම්පාගාරවල අවශ්‍ය උපකරන ගලවාගත් කොල්ලකරුවන් මැඩලීමට එක්සත් ජනපද හමුදා කිසිවක් කලේ නැත. සෑම තැනක ම ප්‍රතිසංස්කරන කටයුතු විනාශකාරී ලෙස නොසෑහෙන බව තහවුරු වී තිබේ.

සාමාන්‍යයෙන් ඉරාක වැසියන්ට ලැබෙන්නේ දිනකට පැය 8ක විදුලිබල සැපයුමක් පමනි. බැග්ඩෑඩයේ පවතින්නේ ඊටත් නරක කොන්දේසිය. අගනුවර මිලියන 7ක ජනතාවගෙන් වැඩි කොටසකට ලැබෙන්නේ දිනකට පැය 6ක හෝ ඊටත් අඩු සේවා සැපයුමක් පමනි.

**මතු සම්බන්ධයි**

© www.wsws.org